සියලුම හිමිකම් ඇවිරිණි.


රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**අ.පො.ස.(උ.පෙළ)විභාගය - 2021 (2022)**

# 52 - නර්තනය (දේශීය)

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන/ සහකාර පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

Department of Examinations - Sri Lanka

# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - 2021 (2022)

## 52 - නර්තනය

## ප්‍රශ්නපත්‍ර ව්‍යුහය හා ලකුණු බෙදීයාම

### I පත්‍රය

කාලය පැය 02 යි.

වරණ 5 න් යුත් බහුවරණ ප්‍රශ්න 25 ක් හා කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 25 කි.

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ප්‍රශ්න 50 කි. (50 x 02) මුළු ලකුණු 100 කි.

### II පත්‍රය

කාලය පැය 03 යි.

මෙම ප්‍රශ්න පත්‍රය I, II හා III වශයෙන් කොටස් තුනකින් සමන්විත වේ.

I කොටස - රචනා වර්ගයේ ප්‍රශ්න 02 කි.
1 හා 2 ප්‍රශ්න අනිවාර්ය වේ.

II කොටස - රචනා වර්ගයේ ප්‍රශ්න 04 කි.
අවම වශයෙන් එක් ප්‍රශ්නයකටවත් පිළිතුරු සැපයිය යුතුය.

III කොටස - රචනා වර්ගයේ ප්‍රශ්න 03 කි.
අවම වශයෙන් එක් ප්‍රශ්නයකටවත් පිළිතුරු සැපයිය යුතුය.

II හා III කොටස්වලින් අවම වශයෙන් එක් ප්‍රශ්නය බැගින් හෝ තෝරාගෙන, අනිවාර්යය ප්‍රශ්න 02 ද ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සැපයිය යුතුය.

සෑම ප්‍රශ්නයකම (i) කොටසට ලකුණු 06 ක්ද (ii) කොටසට ලකුණු 06 ක්ද (iii) කොටසට ලකුණු 08 ක්ද වශයෙන් මුළු ලකුණු 20 බැගින් හිමිවේ.

| | |
|---|---|
| පළමු පත්‍රය (ප්‍රශ්න 50 x 2) | ලකුණු 100 |
| දෙවන පත්‍රය (ප්‍රශ්න 20 x 5) | ලකුණු 100 |
| I හා II පත්‍ර සඳහා 100 + 100 | ලකුණු 200 / 2 |
| අවසාන ලකුණු | ලකුණු 100 |

Department of Examinations - Sri Lanka

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.

2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.

3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ..................................................... √ △ $\frac{4}{5}$
.....................................................
.....................................................

(ii) ..................................................... √ △ $\frac{3}{5}$
.....................................................
.....................................................

(iii) ..................................................... √ △ $\frac{3}{5}$
.....................................................
.....................................................

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.

2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

Department of Examinations - Sri Lanka

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න.

***

Department of Examinations - Sri Lanka

**අභිමතාර්ථ -**

I වන ප්‍රශ්න පත්‍රය

01. දේශීය නර්තන කලාවේ සාම්ප්‍රදායික නර්තන, ගායන, වාදන හා තාල පද්ධතිය පිළිබඳ න්‍යායාත්මක කරුණු අවබෝධයෙන් යුතුව ප්‍රකාශ කරයි.

02. දේශීය නර්තන කලාවේ ඓතිහාසික තොරතුරු, ශාන්තිකර්මවල අනන්‍යතා ලක්ෂණ, ආගමික, සමාජීය හා සංස්කෘතික වටිනාකම අගය කරයි.

03. භාරතීය නර්තනවල සාම්ප්‍රදායික ලක්ෂණ, තාල අවබෝධය හා බටහිර බැලේ සම්ප්‍රදායෙහි විශේෂතා පිළිබඳ අවබෝධයෙන් විශ්ලේෂණය කරයි.

04. ජාතික සංස්කෘති උරුමයන් හා පරිසර නිරීක්ෂණයෙන් ලබන අත්දැකීම් ඇසුරු කරගනිමින් උසස් කලාකෘති හා නිර්මාණ නම් කරයි.

05. නව නර්තන නිර්මාණ, කැටයම් කලාව ආනුෂංගික කලා පිළිබඳ වටිනාකම ප්‍රකාශ කරයි.

II වන ප්‍රශ්න පත්‍රය

01. දේශීය නර්තන කලාවේ සම්ප්‍රදායික නර්තන / ගායන, වාදන හා එහි අන්තර්ගත තාල පද්ධතිය වෙන්කොට හඳුනා ගනිමින් තාල ප්‍රස්තාරකරණය භාවිත කර විශ්ලේෂණය කරයි.

02. දේශීය නර්තන කලාවේ යුගාන්තර විකාශනය, ශාන්තිකර්ම තුලනය, ආගමික, සමාජීය හා සංස්කෘතික වටිනාකම අගය කරයි.

03. භාරතීය නර්තන සම්ප්‍රදා, බටහිර බැලේ රංගකලාව පිළිබඳ ඓතිහාසික තොරතුරු, වෙනස්කම් පිළිබඳ දැනුම, අවබෝධය හා භාවිතයෙන් විශ්ලේෂණ හැකියාව ප්‍රදර්ශනය කරයි.

04. පර්යේෂණ කෘති පරිශීලනයෙහි වටිනාකම හා නිර්මාණාත්මක නර්තන, අද්‍යතන ප්‍රාසංගික වේදිකාව හා ආනුෂංගික කලාවන් අගය කරයි.

05. ජාතික උරුම, සමාජීය පසුබිම මනා චින්තනයෙන් හා උසස් රසඥතාවයෙන් යුතුව අධ්‍යයනය කරමින් බහුවිධ සංස්කෘතිකාංගවල වටිනාකම විචාරාත්මකව විග්‍රහ කරයි.

Department of Examinations - Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

නර්තනය - (දේශීය) - I
நடனம் - (தேசிய) - I
Dancing - (Indigenous) I

52 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය : .......................................

පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා

| පිටු අංකය | ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|---|
| 01 | 01 - 04 | |
| 02 | 05 - 14 | |
| 03 | 15 - 22 | |
| 04 | 23 - 36 | |
| 05 | 37 - 43 | |
| 06 | 44 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අති/ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

**උපදෙස්:**
* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සැපයිය යුතු ය.
* එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.

- අංක 01 සිට 25 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරා, ඊට අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියෙහි ඇති වරහන තුළ ලියන්න.

**1.** "ඇත සිට පෙරුමන් පුරාගෙන මෙතේ මුණි බුදු බව පතාගෙන" මෙම කවිය සාම්ප්‍රදායිකව ගයනු ලබන තිත් රූපය තෝරන්න.
(1) 12 / 123 (2) 12 / 1234
(3) 123 / 123 (4) 123 / 1234
(5) 1234 / 123 (.........)

**2.** පහත් පැලක් සකස් කරගැනීම සඳහා මූලික වශයෙන් යොදාගන්නේ,
(1) ගොප් අත්ත, ඉනි සහ කැඩපතයි. (2) ගොප් අත්ත, ඉනි සහ පහනයි.
(3) හබරල කොළ, ඉනි සහ පහනයි. (4) හබරල කොළ, ඉරටු සහ පනාවයි.
(5) තොලබෝ කොළ, ගොප් අත්ත සහ පහනයි. (.........)

**3.** තිසර සහ සැළලිහිණි සංදේශ කාව්‍ය අයත් වන්නේ පිළිවෙළින් කුමන යුගවලට ද?
(1) මහනුවර, ගම්පොළ (2) මහනුවර, මාතර
(3) කෝට්ටේ, ගම්පොළ (4) ගම්පොළ, කෝට්ටේ
(5) කෝට්ටේ, මහනුවර (.........)

**4.** මූලික බෙර සරඹ නිවැරදිව පුහුණු කිරීම මගින්,
(1) සම්ප්‍රදාය හඳුනාගනියි.
(2) ගායනය සමග වාදන හැකියාව ලබයි.
(3) නිවැරදි අක්ෂර වාදනය කිරීමේ හැකියාව ලබයි.
(4) බෙරයේ ව්‍යුහය හඳුනාගනියි.
(5) නර්තනය සඳහා වාදන හැකියාව ලබයි. (.........)

Department of Examinations - Sri Lanka

5. සාම්ප්‍රදායික ශාන්තිකර්මවල අංගරචනයේදී භාවිත කළ අමුද්‍රව්‍ය පමණක් ඇතුළත් වරණය තෝරන්න.
(1) වෙස්මුහුණු, කටකැලි සහ ශාක යුෂ
(2) පහන් දැලි, කටකැලි සහ පාන් පිටි
(3) වෙස් මුහුණු, පොල්තෙල් සහ පාන් පිටි
(4) පහන් දැලි, අල්ලියාදු කුඩු සහ පොල්තෙල්
(5) ශාක යුෂ, අල්ලියාදු කුඩු සහ අඟුරු (.........)

6. තාල රූපයක් නිර්මාණය වීම සඳහා අවශ්‍ය මූලධර්ම වන්නේ,
(1) ගති, විභාග, ආඝාත, ආවර්ත සහ ලය ය.
(2) ජාති, ගති, තාල, ආඝාත සහ ලය ය.
(3) ජාති, ගති, මිතිය, රීතිය සහ ලය ය.
(4) ජාති, ගති, මිතිය, තාල සහ ලය ය.
(5) ආඝාත, ජාති, ගති, මිතිය සහ ලය ය. (.........)

7. පහතරට නර්තන සම්ප්‍රදායේ මාතර ශෛලියේදී පිල්ලු වීදිය ඉදිකරනු ලබන ශාන්තිකර්මය වන්නේ,
(1) සන්නියකුම ය. (2) රටයකුම ය.
(3) දෙවොල් මඩුව ය. (4) ගම්මඩුව ය.
(5) කිරිමඩුව ය. (.........)

8. රස භාව පිළිබඳ අදහස් දැක්වූ පෙරදිග සහ අපරදිග මතවාදීන් දෙදෙනෙකු වන්නේ පිළිවෙළින්,
(1) භරතමුනි සහ වස්ලව් නිජින්ස්කි ය. (2) නන්දිකේශ්වර සහ වස්ලව් නිජින්ස්කි ය.
(3) ක්‍රිෂ්ණ අයියර් සහ ඇරිස්ටෝටල් ය. (4) භරතමුනි සහ ඇරිස්ටෝටල් ය.
(5) ක්‍රිෂ්ණ අයියර් සහ ප්ලේටෝ ය. (.........)

9. වලියක් මංගල්‍යය සහ කිරිමඩුවට ආවේණික සැරසිලි ලෙස සැලකෙන්නේ පිළිවෙළින්,
(1) ගවරමල සහ කිරිමැස්සයි. (2) නුග අත්ත සහ කිරිමැස්සයි.
(3) ගවරමල සහ කත්තිරික්කයි. (4) සිවිලිය සහ අයිලයයි.
(5) සොළොස්මගල සහ පිදේනි තටුයි. (.........)

10. "මේ පුරයේ හොර වන්ඩි බොහොම ඇත - හැන්දෑ යාමෙදි පාරේ තැනින් තැන" යන කවිය අයත් වන්නේ,
(1) මුදලි කෝලමට ය. (2) නොන්චි කෝලමට ය.
(3) ලෙන්චිනා කෝලමට ය. (4) අණබෙර කෝලමට ය.
(5) ජස කෝලමට ය. (.........)

11. කාව්‍යකරණයේදී සඳැස්මත් යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
(1) ලඝු හා ගුරු මාත්‍රාවල එකතුවයි. (2) ලඝු අක්ෂරවල එකතුවයි.
(3) ලඝු හා ගුරු අක්ෂරවල එකතුවයි. (4) ලඝු මාත්‍රා හා හල් අකුරුවල එකතුවයි.
(5) ගුරු මාත්‍රා හා හල් අකුරුවල එකතුවයි. (.........)

12. "ගජ්ජිත් තත් ජිංතක තරිකිට – ගජිත් කුඳත් ජිං තක තරිකිට"
ඉහත කස්තිරම සඳහා සුදුසු තිත් ප්‍රභේදය වන්නේ,
(1) තුන් සුළු දෙමැදුම් පස් තිතයි. (2) තුන් සුළු දෙමහ පස් තිතයි.
(3) දෙසුළු දෙමහ සිව් තිතයි. (4) දෙමැදුම් දෙමහ සිව් තිතයි.
(5) සුළු දෙමහ තුන් තිතයි. (.........)

13. භරත සහ කථකලි නර්තනයන්හි අභිවෘද්ධිය සඳහා දායකත්වයක් දැක්වූ පුද්ගලයන් වන්නේ පිළිවෙළින්,
(1) බාල සරස්වතී සහ තන්ජාවූර් සහෝදරයන් ය.
(2) රබීන්ද්‍රනාත් තාගෝර් සහ ගෝපි ක්‍රිෂ්ණා ය.
(3) තන්ජාවූර් සහෝදරයන් සහ වල්ලතෝල් නාරායන මෙනන් ය.
(4) උදය ශංකර් සහ වල්ලතෝල් නාරායන මෙනන් ය.
(5) තන්ජාවූර් සහෝදරයන් සහ නවාබ් වජිඩ් අලිෂා ය. (.........)

14. ක්‍රි.ව. 1930 දශකයේ ඉන්දියානු ආභාසය සහිතව නිෂ්පාදනය වූ නෘත්‍ය නාටක දෙකක් වන්නේ,
(1) සීතාහරණ සහ නලදමයන්ති ය. (2) සීතාහරණ සහ ඡද්දන්තදායම් ය.
(3) සීතාහරණ සහ හපනා ය. (4) මනෝහාරබන්ධනම් සහ නලදමයන්ති ය.
(5) ඌර්වශිජායම් සහ ශිවරංග ය. (.........)



Department of Examinations - Sri Lanka

15. "නටන ගහපතියාගේ දුව විසින් පවරා දෙන ලදී" යනුවෙන් නර්තනය පිළිබඳ ඓතිහාසික තොරතුරු දැක්වෙන්නේ,
(1) පාලමොට්ටායි සෙල්ලිපියෙහි ය. (2) කාලිංග උද්‍යාන සෙල්ලිපියෙහි ය.
(3) කොරවක්ගල සෙල්ලිපියෙහි ය. (4) මැදගම සෙල්ලිපියෙහි ය.
(5) අනුරු සෙල්ලිපියෙහි ය. (.........)

16. කථක් සහ මනිපුරි නර්තන සම්ප්‍රදායයන්ට යොදාගත් අවනද්ධ භාණ්ඩ වන්නේ පිළිවෙළින්,
(1) තබ්ලාව සහ පුං බෙරයයි. (2) තබ්ලාව සහ චෙන්ඩාවයි.
(3) පුං බෙරය සහ කෝල් බෙරයයි. (4) පුං බෙරය සහ පෙනකොම්බාවයි.
(5) පඛාවජ් සහ මද්දලයයි. (.........)

17.



ඉහත රූපයෙන් දැක්වෙන ඇත්පහන සොයාගන්නා ලද්දේ,
(1) අනුරාධපුර කුට්ටම් පොකුණෙන් ය.
(2) පොළොන්නරුව ශිව දේවාලයෙන් ය.
(3) යාපහුව කොටවෙහෙරෙන් ය.
(4) දැදිගම කොටවෙහෙරෙන් ය.
(5) පොළොන්නරුව සැටදාගෙයින් ය. (.........)

18. බලි ඇදුරා භාවිත කරන රංග උපකරණ ලෙස සැලකෙන්නේ,
(1) ජටාව සහ පන්දම වේ. (2) සේලය සහ පන්දම වේ.
(3) අත්මිණිය සහ නවගුණවැල වේ. (4) පන්දම සහ නවගුණවැල වේ.
(5) අත්මිණිය සහ පන්දම වේ. (.........)

19. භරත නාට්‍යම් නර්තනය සඳහා ඉනට සහ කනට පළඳිනු ලබන ආභරණ වන්නේ පිළිවෙළින්,
(1) ඔට්ටියානම් සහ අට්ටියල් ය. (2) ඔට්ටියානම් සහ ජිමික්කි ය.
(3) උච්චිපට්ටම සහ ජිමික්කි ය. (4) උච්චිපට්ටම් සහ සලංගෙයි ය.
(5) ජිමික්කි සහ මාට්ටල් ය. (.........)

20. "ධීර ගුණැති දීපංකර මුනි බුදු වෙමිනේ" මෙය,
(1) නමස්කාර කවියකි. (2) කඩතුරා කවියකි.
(3) සුවිසි විවරණ කවියකි. (4) සිරසපාද කවියකි.
(5) ග්‍රහපංති කවියකි. (.........)

21. "ඔහොම තනියම ගිහිල්ලා විදින්න බැහැ. දඩ මීමෙකුට මුවාවෙලා විදගන්න ඕන." මෙම දෙබස ඇතුළත් නාට්‍යමය අවස්ථාව දැක්වෙන්නේ,
(1) පහන් මඩුවේ පොත්කඩේ යක්කමේදී ය.
(2) පහන් මඩුවේ අඹවිදමනේදී ය.
(3) කොහොඹා කංකාරියේ ගබඩා කොල්ලයේදී ය.
(4) කොහොඹා කංකාරියේ ඌරා යක්කමේදී ය.
(5) සන්නි යකුමේ වැදි සන්නියේදී ය. (.........)

22. 'රටයකුම හෙවත් රිද්දියාගය' සහ 'කොහොඹා යක් කංකාරිය සහ සමාජය' යන කෘති රචනා කරන ලද්දේ පිළිවෙළින්,
(1) ආරියරත්න කළුආරච්චි සහ එදිරිවීර සරච්චන්ද්‍ර ය.
(2) තිස්ස කාරියවසම සහ මුදියන්සේ දිසානායක ය.
(3) මුදියන්සේ දිසානායක සහ ලයනල් බෙන්තරගේ ය.
(4) ලයනල් බෙන්තරගේ සහ තිස්ස කාරියවසම ය.
(5) එදිරිවීර සරච්චන්ද්‍ර සහ ඩබ්ලිව්. බී. මකුලොලුව ය. (.........)



Department of Examinations - Sri Lanka

23. අංග රචනය හා බැඳි මූලිකාංග වන්නේ,
(1) දිසා, තල, රේඛා සහ හැඩතල ය.
(2) අවකාශය, රේඛා, හැඩතල සහ වේශභූෂණ ය.
(3) වර්ණ, රේඛා, හැඩතල සහ ආලෝකකරණය ය.
(4) වර්ණ, රේඛා, තල සහ රංග වස්ත්‍රාභරණ ය.
(5) වර්ණ, රේඛා, හැඩතල සහ අමුද්‍රව්‍ය ය. (.........)

24. ආලෝකකරණයේදී භාවිත ප්‍රධාන වර්ණ තුන ලෙස සැලකෙන්නේ,
(1) රතු, කොළ සහ නිල් ය. (2) රතු, සුදු සහ නිල් ය.
(3) නිල්, කොළ සහ දම් ය. (4) කොළ, රතු සහ කහ ය.
(5) කහ, රතු සහ සුදු ය. (.........)

25. අවකාශ භාවිතයේ ප්‍රධාන කොටස් දෙක වන්නේ,
(1) දස දිසා සහ සම්බන්ධතා අවකාශයයි.
(2) පෞද්ගලික අවකාශය සහ තල භාවිතයයි.
(3) පොදු අවකාශය සහ පෞද්ගලික අවකාශයයි.
(4) පොදු අවකාශය සහ දස දිශාවයි.
(5) සම්බන්ධතා අවකාශය සහ පෞද්ගලික අවකාශයයි. (.........)

- අංක 26 සිට 35 තෙක් දී ඇති එක් එක් වාක්‍යයේ හිස්තැනට සුදුසු වචන/වචනය යොදන්න.

26. දක්ෂිණ භාරතයේ 'චක්කියාර්කූත්තු' සංස්කෘතිකාංගය අයත් වනුයේ .................................. නර්තන සම්ප්‍රදායට ය.

27. දේශීය නර්තනයේදී ලය මානය හා තාලයේ වේගය පවත්වා ගැනීමට යොදාගන්නා ඝන වාද්‍ය භාණ්ඩයක් ලෙස .................................. හඳුන්වා දිය හැකි ය.

28. කථක් නර්තනය සඳහා යොදාගත් ඉපැරණි තත් වාද්‍ය භාණ්ඩය .................................. නමින් හැඳින්වේ.

29. ධ්‍රැව තාල සහ අථ තාල දක්ෂිණ භාරතීය .................................. තාල පද්ධතියට අයත් වේ.

30. "දොංත ගතම් දොංත ගදිගතම් – තත් රෙගතම් තත් රෙගදි ගතම්" යන බෙර පදයෙන් .................................. කෝලම සභාවට පිවිසේ.

31. එස්. එල්. බී. කපුකොටුව මහතාගේ ප්‍රධානත්වයෙන් ලංකා ගාන්ධර්ව සභාව පිහිටුවන ලද්දේ .................................. වර්ෂයේදී ය.

32. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉදිකර ඇති එදිරිවීර සරච්චන්ද්‍ර එළිමහන් රංගපීඨය .................................. රංගභූමි ආකෘතිය අනුව නිර්මාණය වූවකි.

33. 'බැරිසිල්' මුද්‍රා නාට්‍යය නිෂ්පාදනය කරන ලද්දේ .................................................. විසිනි.

34. ආධුනිකයෙකු තම්මැට්ටම වාදනය පුහුණුවීම සඳහා යොදාගනු ලබන්නේ .................................. ය.

35. උඩැක්කියේ හඬ සුසර කරගැනීම සඳහා කිතුල් තතක් හෝ .................................. කෙඳි භාවිත කරනු ලබයි.

- අංක 36 සිට 50 තෙක් ප්‍රශ්නවලට අදාළ පිළිතුරු **තිත් ඉර** මත ලියන්න.

36. බලි ශාන්තිකර්මයේදී හිරු ග්‍රහයාට සහ සිකුරු ග්‍රහයාට අයත් වර්ණ නම් කරන්න.
(i) හිරු : ..........................................
(ii) සිකුරු : ..........................................

Department of Examinations - Sri Lanka

**37.** සුරත් තට්ටුව සහ කුන්දිරම්පල්ල යන කොටස් අයත් වන අවනද්ධ වාද්‍ය භාණ්ඩ මොනවා ද?

(i) සුරත් තට්ටුව : ........................................

(ii) කුන්දිරම්පල්ල : ........................................

**38.**



(i)



(ii)

රටයකුම හෙවත් රිද්දියාගයේ ඉහත (i) රූපයෙන් දැක්වෙන රංග අවස්ථාව හා (ii) රූපයෙන් දැක්වෙන රංග භාණ්ඩය නම් කරන්න.

(i) රංග අවස්ථාව : ........................................

(ii) රංග භාණ්ඩය : ........................................

**39.** හංස වන්නම පද රචනය හා රංග වින්‍යාසය සිදු කළ නිර්මාණකරුවන් **දෙදෙනා** නම් කරන්න.

(i) පද රචනය : ........................................

(ii) රංග වින්‍යාසය : ........................................

**40.** ඊශ්වර කුණ්ඩතාලය සහ කුදිරඩි යන දෙමළ නාමයන්ගෙන් හඳුන්වන වන්නම් අයත් වනුයේ කුමන නර්තන සම්ප්‍රදායයන්ට ද?

(i) ඊශ්වර කුණ්ඩතාලය : ........................................

(ii) කුදිරඩි : ........................................

- අංක **41** සහ **42** යන ප්‍රශ්නවලට පහත දැක්වෙන කවි පදය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

"රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙළ දිදී විදුලිය පබා ......"

**41.** ඉහත කවිය අයත් කාව්‍ය ග්‍රන්ථය හා එය ලියැවුණු යුගය ලියන්න.

(i) කාව්‍ය ග්‍රන්ථය : ........................................

(ii) යුගය : ........................................

**42.** ඉහත කවි පදයේ ලඝු සහ ගුරු මාත්‍රා සංඛ්‍යාව ගණනය කොට දක්වන්න.

(i) ලඝු : ........................................

(ii) ගුරු : ........................................

**43.** ජෝන් ඩේවිගේ කෘතියට අනුව කවිකාර, තඹුරු පුරප්පෙට්ටුකාර, සිංගක්කාර යන ඉලංගම් හැර රජවාසලේ පැවති ඉතිරි ආයතන **දෙක** නම් කරන්න.

(i) ........................................ ඉලංගම

(ii) ........................................ ඉලංගම

Department of Examinations - Sri Lanka

**44.** අවනද්ධ භාණ්ඩ වාදනයේදී මූලික අක්ෂර සහ අනු අක්ෂර හඳුන්වන පාරිභාෂිත වචන දක්වන්න.

(i) මූලික අක්ෂර : ..........................................

(ii) අනු අක්ෂර : ..........................................

**45.** කරදිය මුද්‍රා නාට්‍යයේ රංග රචනය සහ පසුතල නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(i) රංග රචනය : ..................................

(ii) පසුතල නිර්මාණය : ..................................

**46.** නෙළුම් කවි සහ ප්‍රශස්ති අයත්වන ගායනා වර්ග වෙන්කොට දක්වන්න.

(i) නෙළුම් කවි : ..........................................

(ii) ප්‍රශස්ති : ..........................................

**47.** පහත දැක්වෙන වේදිකා නාට්‍ය අයත්වන නාට්‍ය ශෛලීන් නම් කරන්න.

(i) දෙපානෝ : ..........................................

(ii) මනමේ : ..........................................

**48.** කිරිමඩුවේ පුද ලබන ප්‍රධාන දෙවියා සහ එය පැවැත්වීමේ මූලික අරමුණ ලියා දක්වන්න.

(i) ප්‍රධාන දෙවියා : ....................................

(ii) මූලික අරමුණ : ....................................

**49.** 'උත්සහ' සහ 'හාස' භාව මගින් නිෂ්පත්ති වන රස ලියා දක්වන්න.

(i) උත්සහ : ..........................................

(ii) හාස : ..........................................

**50.**





ඉහත රූපවලින් නිරූපිත චරිතය හා ඊට අදාළ ශාන්තිකර්මය කුමක් ද?

(i) චරිතය : ..........................................

(ii) ශාන්තිකර්මය : ..........................................

* * *



Department of Examinations - Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2021 (2022)

| | | | |
|---|---|---|---|
| විෂය අංකය<br>பாட இலக்கம் | 52 | විෂයය<br>பாடம் | නර්තනය (දේශීය) |

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය/பத்திரம் I

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|
| 01. | 4 | 11. | 1 | 21. | 4 |
| 02. | 2 | 12. | 2 | 22. | 2 |
| 03. | 4 | 13. | 3 | 23. | 5 |
| 04. | 3 | 14. | 2 | 24. | 1 |
| 05. | 4 | 15. | 3 | 25. | 3 |
| 06. | 5 | 16. | 1 | | |
| 07. | 1 | 17. | 4 | | |
| 08. | 4 | 18. | 5 | | |
| 09. | 1 | 19. | 2 | | |
| 10. | 5 | 20. | 3 | | |

✪ විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :

එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு 02 ලකුණු බැගින්/புள்ளி வீதம்

මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 25 = 50

Department of Examinations - Sri Lanka

## I පත්‍රය

26. කතකලි

27. තාලම්පට

28. සාරංගිය

29. කර්ණාට

30. නොංචි

31. 1936

32. ග්‍රීක/එපිඩෝර්ස්

33. ආරියරත්න කළුආරච්චි

34. කොට්ටබිස්ස

35. නියඳ

| | | |
|---|---|---|
| 36. | i. රතු/ රක්ත | ii. සුදු/ ස්වේත |
| 37. | i. ගැටබෙරය | ii. තම්මැට්ටම |
| 38. | i. දරුනැළවිල්ල | ii. කපු යන්ත්‍රය |
| 39. | i. අරිසෙන් අහුබුදු | ii. ප්‍රේමකුමාර එපිටවෙල |
| 40. | i. පහතරට | ii. සබරගමු |
| 41. | i. ගුත්තිල කාව්‍ය | ii. කෝට්ටේ |
| 42. | i. 12 | ii. 7 |
| 43. | i. නැටුම් | ii. වාහල |
| 44. | i. බීජාක්ෂර | ii. ගර්භාක්ෂර |
| 45. | i. චිත්‍රසේන ඩයස් | ii. සෝමබන්ධු විද්‍යාපති |
| 46. | i. මෙහෙ ගී | ii. සේ ගී |
| 47. | i. ගීත නාට්‍ය | ii. ශෛලීගත නාට්‍ය |
| 48. | i. මංගර | ii. ගවපට්ටි සංරක්ෂණය |
| 49. | i. වීර | ii. හාස්‍ය |
| 50. | i. මහාකෝල සන්නිය | ii. සන්නියකුම/ දහඅට සන්නිය |

**ප්‍රශ්න අංක 01 - 25 දක්වා (02 x 25) ලකුණු 50**

**ප්‍රශ්න අංක 26 - 50 දක්වා (02 x 25) ලකුණු 50**

**මුළු ලකුණු 100**

Department of Examinations - Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

නර්තනය - (දේශීය) II
நடனம் - (தேசிய) II
Dancing - (Indigenous) II

52 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය **I, II** හා **III** වශයෙන් කොටස් **තුනකින්** සමන්විත වේ.
* **I** කොටසේ **1** හා **2** ප්‍රශ්න අනිවාර්ය වේ.
* **II** හා **III** කොටස්වලින් අවම වශයෙන් **එක්** ප්‍රශ්නය බැගින් හෝ තෝරාගෙන, අනිවාර්ය ප්‍රශ්න **දෙක** ද ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සැපයිය යුතු ය.
* සෑම ප්‍රශ්නයකම (i) කොටසට ලකුණු **06**ක් ද (ii) කොටසට ලකුණු **06**ක් ද (iii) කොටසට ලකුණු **08**ක් ද වශයෙන් මුළු ලකුණු **20**ක් බැගින් හිමි වේ.

## I කොටස

**1.** (i) පහත සඳහන් බෙර පද අතුරෙන් ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අයත් බෙර පදය තෝරාගෙන ප්‍රස්තාර කරන්න.

* තෙහිං තකු තෙහිං තකු තෙහිං ජිං ගත්තත් ජිං තරිකිට
* දිත්තම් දිතකු දොම් දොම් තාම්
* කුඳක් තක්කිට තකට ජිමිතකු

(ii) පහත සඳහන් කවි පදය මැදුම් මහ දෙතිතේ තාල රූපයට අනුව ප්‍රස්තාර කරන්න.
"රූපයක් ඇති මුහුණු සයකින් අත් දොළසකින් බබුලුවාගෙන"

(iii) ගණපති වන්නමේ අඩව්ව හෝ තිසරා වන්නමේ අඩව්ව හෝ ශුද්ධ මාත්‍රයේ මැදුම් තනිතිතට අදාළ ඉරට්ටිය හෝ ප්‍රස්තාර කරන්න.

**2.** ශ්‍රී ලාංකේය නර්තනය සමාජ පරිණාමය සමග ප්‍රවර්ධනය වූ කලාවකි.

(i) ශ්‍රී ලංකාවේ වෘත්තීය නර්තන කලාවක් පැවැති බවට තහවුරු කෙරෙන පුරාවිද්‍යා මූලාශ්‍රය **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) දේශීය නර්තනය කෙරෙහි භාරතීය ආභාසය ලැබී ඇති බව කෝට්ටේ යුගයේ රචිත සංදේශ කාව්‍ය **දෙකක්** ඇසුරෙන් තහවුරු කරන්න.

(iii) ක්‍රි.ව. 1900 – 1950 දක්වා අඩසියවසෙහිදී, දේශීය නර්තන කලාව ශාන්තිකර්ම රඟමඬලින් බැහැරට යොමුවී ඇති ආකාරය සාධක **හතරක්** ඇසුරෙන් පහදන්න.

## II කොටස

**3.** ශාන්තිකර්ම ශිල්පියා සමාජ යහපැවැත්ම වෙනුවෙන් කටයුතු කරන්නෙකු මෙන්ම විවිධ ආනුෂංගික නිර්මාණ හැකියාවන්ගෙන් ද පෝෂණය වූ අයෙකි.

(i) රටයකුම ශාන්තිකර්මයේ විදි සැරසිලි **තුනක්** නම් කරන්න.

(ii) කිරිමඩුව ශාන්තිකර්මය හා බැඳි සමාජ සාරධර්ම **දෙකක්** පිළිබඳ සාකච්ඡා කරන්න.

(iii) "බලි ශාන්තිකර්ම ශිල්පියා විවිධ දක්ෂතාවන්ගෙන් පෝෂණය වූවෙකි." කරුණු **හතරක්** ඇසුරෙන් විමසන්න.

4. ශ්‍රී ලාංකේය ශාන්තිකර්මයන්හි සම විෂමතා මෙන්ම ආවේණික විශේෂතා ද විද්‍යමාන වේ.

   (i) වලියක් මංගල්‍ය ශාන්තිකර්මයට ආවේණික සැරසිලි **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

   (ii) 'සන්නියකුම' ශාන්තිකර්මයේ මාතර සහ බෙන්තර ශෛලීන්හි අනන්‍යතා ලක්ෂණ **තුනක්** පූජාවිධි පිළිවෙළ ඇසුරෙන් වෙන්කර දක්වන්න.

   (iii) ඌරා යක්කමේ නාට්‍යමය ලක්ෂණ මතුකිරීම සඳහා වාචික හා ආහාර්ය අභිනය භාවිත කර ඇති අයුරු විමසන්න.

5. ගැමි නැටුම් සහ ගායනා මගින් ග්‍රාමීය සංස්කෘතිය පිළිබිඹු කරයි.

   (i) ගැමි නර්තනයන්හි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

   (ii) ජන ජීවිතයේ ඇදහිලි හා විශ්වාස පිළිබඳ ගැමි නැටුම් **දෙකකට** අයත් ගායනා ඇසුරෙන් පැහැදිලි කරන්න.

   (iii) සිංහල හා දෙමළ සාංස්කෘතික සමානතා, ගැමි නැටුම් **හතරක්** ඇසුරෙන් සංසන්දනාත්මකව විග්‍රහ කරන්න.

## III කොටස

6. පහත සඳහන් වගුවෙහි (අ), (ආ) සහ (ඉ) යන කොටස්වලට අදාළ ව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| (අ) කොටස | (ආ) කොටස | (ඉ) කොටස |
|---|---|---|
| පරන් | බැරිසිල් | කැතරින් ඩී. මෙඩිසි |
| ථුම්රි | ජීවන රිද්මය | චෛකොව්ස්කි |
| ශබ්දම් | කල්පනා | 14 වන ලුවි |
| අලාරිප්පු | නිදිකුමරිය | මාරියස් පෙටිපා |

   (i) (අ) කොටස - භරත නාට්‍යම් සම්ප්‍රදායට අයත් 'නෘත්‍ය' අංගය තෝරාගෙන ඒ පිළිබඳ විස්තරයක් කරන්න.

   (ii) (ආ) කොටස - බටහිර බැලේ සහ දේශීය මුද්‍රා නාට්‍ය කෘති දෙක තෝරාගෙන ඒ පිළිබඳ විමසුමක් කරන්න.

   (iii) (ඉ) කොටස - බැලේ නර්තන කලාව ප්‍රංශය දක්වා ව්‍යාප්තියට පුරෝගාමී වූ දෙදෙනා නම් කර එහි ප්‍රවර්ධනයට ඔවුන්ගේ දායකත්වය ලැබී ඇති ආකාරය අගයන්න.

7. නර්තන කලාව ප්‍රවර්ධනයෙහිලා පෙර අපර දෙදිග සංස්කෘතික සබඳතා ඉවහල් වී ඇත.

   (i) "පටාචාරා කලා කෘතිය විවිධ නර්තන ශෛලීන්ගෙන් පෝෂණය වූවකි." පහදන්න.

   (ii) නර්තන කලාවේ නව ප්‍රවණතා කෙරෙහි ජනමාධ්‍යයේ බලපෑම නිදසුන් **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න.

   (iii) බටහිර හා පෙරදිග රටවල සංස්කෘතික ලක්ෂණ දේශීය නර්තනයට බලපා ඇති ආකාරය කරුණු **හතරක්** ඇසුරෙන් විමසුමට ලක් කරන්න.

8. අංග රචනය සහ රංග වස්ත්‍රාභරණ නිර්මාණය නර්තන කලාව හා බැඳි විස්තාරණය වූ විශේෂාංග වේ.

   (i) අද්‍යතනයේ අංග රචනය සඳහා යොදාගන්නා ප්‍රධාන අමුද්‍රව්‍ය **දෙකක්** නම් කර ඒ පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

   (ii) රංග වස්ත්‍රාභරණ නිර්මාණය කිරීමේදී අංග, ප්‍රත්‍යංග හා උපාංග පිළිබඳ සැලකිලිමත් විය යුතු බව සාම්ප්‍රදායික ඇඳුම් කට්ටලයක් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

   (iii) ආලෝක වර්ණ (Light colour) හා ද්‍රව්‍ය වර්ණ (Pigment colour) රංග වස්ත්‍රාභරණ සඳහා වැදගත්වන ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

* * *

Department of Examinations Sri Lanka

# I කොටස

01. (i) පහත සඳහන් බෙර පද අතුරින් ඔබ උගත් නර්තන සම්ප්‍රදායට අයත් බෙර පදය තෝරා ගෙන ප්‍රස්තාර කරන්න.

- තෙහිං තකු තෙහිං තකු තෙහිං ජිං ගත්තත් ජිං තරිකිට

| | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ^ | | ^ | | / | | | ^ | | ^ | | / | | | |
| 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 |
| තෙහිං | තකු | තෙහිං | තකු | තෙහිං | ජිං | - | ගත් | - | තත් | - | ජිං | තරි | කිට |

- දිත්තම් දිතකු දොම් දොම් තාම්

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ^ | | ^ | | / | | | ^ | | ^ | | / | | |
| 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 |
| දිත් | - | තම් | - | දි | ත | කු | දොම් | - | දොම් | - | තාම් | | |

- කුදත් තක්කිට තකට ජිමිතකු

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ^ | | | ^ | | / | | ^ | | | ^ | | / | |
| 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 | 1 | 2 | 3 | 1 | 2 | 1 | 2 |
| කු | දත් | - | තක් | - | කි | ට | ත | ක | ට | ජි | මි | ත | කු |

නිවැරදි විභාගවලට වෙන්කිරීම හා සංකේත භාවිතයට ලකුණු 02
බෙරපද නිවැරදිව ප්‍රස්තාර කිරීමට ලකුණු 04
මුළු ලකුණු 06

Department of Examinations - Sri Lanka

(ii) පහත සඳහන් කවි පදය මැදුම් මහ දෙතිතේ තාලරූපයට අනුව ප්‍රස්තාර කරන්න.

**"රූපයක් ඇති මුහුණු සයකින් අත් දොළසකින් බබුලුවාගෙන"**

| ^ | | | / | | | | ^ | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 4 |
| + | රූ | ප | යක් | _ | ඇ | ති | මු | හු | ණු | ස | ය | කින් | - |
| + | අත් | දො | ළ | ස | කින් | - | බ | බු | ලු | වා | - | ගෙ | න |

නිවැරදි විභාගවලට වෙන්කිරීම හා සංකේත භාවිතයට ලකුණු 02
බෙරපද නිවැරදිව ප්‍රස්තාර කිරීමට ලකුණු 04
මුළු ලකුණු 06

(iii) ගණපති වන්නමේ අඩව්ව හෝ තිසරා වන්නමේ අඩව්ව හෝ ශුද්ධ තාලයේ මැදුම් තනි තිතට අදාළ ඉරට්ටිය හෝ ප්‍රස්තාරය කරන්න

- **ගණපති වන්නමේ අඩව්ව**

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| තාත් | - | - | ත | ක | ට | තරි | කිට | දොද් | දොම් | - | - |
| තරි | කිට | දොද් | දොම් | ගත් | තත් | තරි | කිට | දොද් | දොම් | - | - |
| ගත් | - | ත | කු | ත | ක | ජිත් | - | ත | කු | ත | ක |
| තරි | කිට | දොද් | දොම් | ගත් | තත් | තරි | කිට | දොද් | දොම් | | |

- **තිසරා වන්නමේ අඩව්ව**

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| ජෙං | - | ත | ත | ක | ට | දිරි | කිට | තරි | කිට | ග | ත |
| ග | ත | කු | ද | ග | ත | ග | තත් | - | ජෙ | ජෙං | - |
| තක් | - | කිත් | - | තක් | - | කි | තත් | - | ජෙ | ජෙං | - |
| තා- | - | කුන් | දත් | තරි | කිට | ග | තත් | - | කු | කු | ද |
| තා | | | | | | | | | | | |

Department of Examinations - Sri Lanka

- **ශුද්ධ මාත්‍රයේ මැදුම් තනි තිතට අදාළ ඉරට්ටිය**

| / | | | / | | | / | | | / | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 | 1 | 2 | 3 |
| රුඳ | ගත | ගත | ගදි | තග | තම් | ගත් | දිත් | තත් | දොං | තකු | දොම් |
| රුඳ | ගත | ගත | ගදි | තග | තම් | දෙග | දිත් | තත් | දොං | තකු | දොම් |
| රුඳ | ගත | ගත | ගදි | තග | තම් | රුද | ගත | ගත | ගදි | තග | තම් |
| ගදි | තග | තම් | ගුදි | තගු | දම් | ගත් | දිත් | තත් | දෙග | දිත් | තත් |
| දෙග | දිත් | දෙග | දිත් | දෙග | දිත | ගත | ගුදි | තග | රෙගු | ද | කු |
| දොම් | | | | | | | | | | | |

**නිවැරදි විභාගවලට වෙන් කිරීම හා සංකේත භාවිතය ලකුණු 02**

**බෙරපද නිවැරදිව ප්‍රස්තාර කිරීමට ලකුණු 06**

**මුළු ලකුණු 08**

**(i) 6 + (ii) 6 + (iii) 8 = මුළු ලකුණු 20**

02. ශ්‍රී ලාංකේය නර්තනය සමාජ පරිණාමය සමග ප්‍රවර්ධනය වූ කලාවකි.

(i) ශ්‍රී ලංකාවේ වෘත්තීය නර්තන කලාවක් පැවති බවට තහවුරු කෙරෙන පුරාවිද්‍යා මූලාශ්‍රය දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

- සැස්සේරුව සෙල්ලිපිය
- සිතුල්පව්ව, කොරවග්ගල, සෙල්ලිපිය
- පාලමොට්ටායි සෙල්ලිපිය

**මූලාශ්‍රය දෙකක් නම් කිරීමට ලකුණු 02**

**වෘත්තීය නර්තන කලාවක් පැවති බවට තහවුරු කිරීම ලකුණු 04**

**මුළු ලකුණු 06**

Department of Examinations - Sri Lanka

(ii) දේශීය නර්තනය කෙරෙහි භාරතීය ආභාෂය ලැබී ඇති බව කෝට්ටේ යුගයේ රචිත සංදේශ කාව්‍ය දෙකක් ඇසුරෙන් තහවුරු කරන්න.

- භරත සතර පෙර ඉසිවර කී ලෙසට .................... (සැළලිහිණි සංදේශය)
- ලෙලදුන් නව තඹ පලුවන් පාදේ ...........................(පරෙවි සංදේශය)
- අඳිමින් සුදුපට සළු ගෙල සඳුනෙන් තුනු තවරා ........... (කෝකිල සංදේශය)

**කෝට්ටේ යුගයේ සංදේශ කාව්‍ය දෙකක් නම් කිරීමට ලකුණු** 02

**අදාළ කවි දෙකක් ඇසුරෙන් භාරතීය ආභාෂය තහවුරු කර ඇත්නම් ලකුණු** 04

**මුළු ලකුණු** 06

(iii) ක්‍රි.ව. 1900 - 1950 දක්වා අඩසියවසෙහිදී දේශීය නර්තන කලාව ශාන්තිකර්ම රඟ මඩලින් බැහැරට යොමු වී ඇති ආකාරය සාධක **හතරක්** ඇසුරෙන් පහදන්න.

- 1918 දී නුගවෙල මහ දිසාව විසින් කොහොඹායක් කංකාරියට සීමා වී පැවති උඩරට වෙස් නර්තනය මහනුවර දළඳා පෙරහැරට එක් කර ඇති බව
- 1930 දශකය චන්ද්‍රලේඛා මහත්මිය සහ මේරියම් පීරිස් මහත්මිය නර්තන කලාවට ප්‍රවිෂ්ට වී ඇති බව
- 1934 රවීන්ද්‍රනාත් තාගෝර් තුමාගේ ශ්‍රී ලංකා සංචාරය මගින් දේශීය නර්තන කලාවේ නියැළුණු කලාකරුවන් වේදිකා රංගනය සඳහා යොමු වූ බව
- 1943 රජයේ පාඨශාලාවල දේශීය නර්තනය ඉගැන්වීම ආරම්භ කිරීම හා නර්තන ගුරුවරුන් බඳවා ගත් බව
- 1945 වර්ෂයේ දී S.L.B. කපුකොටුව මහතා නර්තන විෂය සඳහා අධ්‍යක්ෂකවරයෙකු ලෙස පත් කළ බව

**සාධක 04 ක් නිවැරදිව නම් කිරීමට ලකුණු** 04

**පැහැදිලි කිරීමට ලකුණු** 04

**මුළු ලකුණු** 08)

**(i) 6 + (ii) 6 + (iii) 8 = මුළු ලකුණු** 20

**(03) ශාන්තිකර්ම ශිල්පියා සමාජ යහපැවැත්ම වෙනුවෙන් කටයුතු කරන්නෙකු මෙන්ම විවිධ ආනුෂංගික නිර්මාණ හැකියාවන්ගෙන් ද පෝෂණය වූ අයෙකි.**

(i) රටයකුම ශාන්තිකර්මයේ වීදි සැරසිලි තුනක් නම් කරන්න.

- මල්මඩුව/ රිද්දියාග මණ්ඩපය/රටයකුම් වීදිය
- නවමල්පාය



Department of Examinations - Sri Lanka

- වටකුමාර වීදිය
- මුදුන්මාල තොරණ
- සූනියම් වීදිය
- දහඅටපාලි තොරණ

**සැරසිලි තුනක් නම් කිරීමට ලකුණු 06**

(ii) කිරිමඩුව ශාන්තිකර්මය හා බැඳි සමාජ සාරධර්ම දෙකක් පිළිබඳ සාකච්ඡා කරන්න.

- කිරි ඉතිරවීමෙන් සෞභාග්‍ය සශ්‍රීකත්වය පතා කටයුතු කරන බව
- සාමූහිකත්වය, සහජීවනය හා සමගිය ඇතිවන පරිදි කහරොටි දානය ද ලබා දෙන බව
- වෙන් කරන ලද සහල් වලින් බතක් පිස දෙවියන්ට පිදෙන බව
- කළගුණ/ කෘතගුණ සැලකීමක් ලෙස ගව මහීෂාදීන් ආරක්ෂා කෙරෙන බව
- උපත් කතාවෙන් පිළිබිඹු වන සාරධර්ම සාකච්ඡා කර ඇත්නම්

**සමාජ සාරධර්ම දෙකක් හඳුනා ගෙන ඇත්නම් ලකුණු 02**
**සාකච්ඡා කිරීමට ලකුණු 04**
**මුළු ලකුණු 06**

(iii) ''බලිශාන්තිකර්ම ශිල්පියා විවිධ දක්ෂතාවන්ගෙන් පෝෂණය වූවෙකි'' කරුණු හතරක් ඇසුරෙන් විමසන්න.

- ගායනය
- වාදනය
- චිත්‍රණය
- ඇඹීම
- නෙළීම
- කැටයම්
- ජ්‍යෝතිෂය

**කරුණු හතරක් හඳුනාගෙන ඇත්නම් ලකුණු 04**
**අදාළ කරුණු ඇසුරෙන් විමසා තිබීම ලකුණු 04**
**මුළු ලකුණු 08**
**(i) 6 + (ii) 6 + (iii) 8 = මුළු ලකුණු 20**

**(04) ශ්‍රී ලාංකේය ශාන්තිකර්මයන්හි සම විෂමතා මෙන්ම ආවේණික විශේෂතා ද විද්‍යමාන වේ.**

(i) වලියක් මංගල්‍ය ශාන්තිකර්මයට ආවේණික සැරසිලි **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

- **සොළොස් මඟල**
  - වලියක් මංගල්‍යයේ විශේෂ සැරසිල්ලක් බව

Department of Examinations - Sri Lanka

- ➢ රංග භූමිය මැද සහල්වලින් සරසන සැරසිල්ලට සහල්, බුලත්, මැටිපහන්, පොල්ගෙඩි, සුදුනූල් ........... වැනි ද්‍රව්‍ය යොදා ගන්නා බව

- **ගවරමල**
  - ➢ රඟමඩල වහලයේ බාල්කයෙහි එල්ලා ඇති ගොප්කොළ සහ පොල් මල් සැරසිල්ලක් බව
  - ➢ උණ ලී කැබැල්ලක් ආධාරයෙන් සකස් කර එහි ආකෘතිය පැරණි ග්‍රැමෆෝන් යන්ත්‍රයේ මලෙහි හැඩයට සමාන බව

- **සිවිලි වළං**
  - ➢ කුඩා මුට්ටි දොළසක් මත නීලවර්ණ රෙදිකඩක් අතුරා සරසන බව
  - ➢ විවිධ වර්ණ මල්, සුවඳ වර්ග, පඬුරු ඒ මත තබන බව

**සැරසිලි දෙකක් නම් කිරීමට ලකුණු** 02
**එම සැරසිලි කෙටියෙන් විස්තර කිරීමට ලකුණු** 04
**මුළු ලකුණු** 06

(ii) 'සන්නියකුම' ශාන්තිකර්මයේ මාතර හා බෙන්තර ශෛලීන්හි අනන්‍යතා ලක්ෂණ තුනක් පූජා විධි පිළිවෙළ ඇසුරෙන් වෙන් කර දක්වන්න.

- **බෙන්තර ශෛලිය**
  - ➢ ආතුරයා යාග මණ්ඩපයට කැඳවා තුණුරුවන් සිහිකර පහන් දල්වා ආතුර පන්දලම වෙත ගෙන යන බව
  - ➢ හැන්දෑ සමයම අවස්ථාවේ දී දිෂ්ඨි මන්තර කීමෙන් අනතුරුව කඩතුරා කවි ගායනා කරමින් එය ඉවත් කරන බව
  - ➢ අෂ්ඨමංගල වස්තූන් ආතුර දෙපයේ පය ගැන්වෙන බව
  - ➢ පබළු ඇඳුම් කට්ටලයෙන් ඇඳුරන් සැරසී කුමාර පෙළපාලිය හෙවත් ලිච්ඡවී නර්තනය ඉදිරිපත් කෙරෙන බව

- **මාතර ශෛලීය**
  - ➢ තුණුරුවන් උදෙසා මල් පහන් පූජා කිරීමක් නොකෙරෙන අතර සූනියම් දෙවියන් වෙනුවෙන් පහන් දැල්වීම සිදුකරන බව
  - ➢ යාදිනි කන්නලව්, උපත්කවි ගායනා කර පිදේනි කැප කිරීම ආතුරයා අතින් සිදු කරන බව
  - ➢ මහ සමයමේදී අදාළ ඇඳුම් කට්ටලයෙන් සැරසී සමයම් පද, පන්දම් පද නැටීම සිදු කෙරෙන බව
  - ➢ දරහැව පිදේනිය කැප කරන බව

**අනන්‍යතා ලක්ෂණ තුනක් හඳුනාගෙන වෙන්කර දක්වා ඇත්නම් ලකුණු 2 X 3 = 06**

Department of Examinations - Sri Lanka

(iii) ඌරා යක්කමේ නාට්‍යමය ලක්ෂණ මතු කිරීම සඳහා වාචික හා ආහාර්ය අභිනය භාවිත කර ඇති අයුරු විමසන්න.

- **වාචික අභිනය**
  - ➢ මලය රජුගේ උයන විනාශ කළ ඌරාට සම්බන්ධ පුවත සංවාද මගින් ගෙනහැර දැක්වීම
  - ➢ දෙබස් හා සංවාද උදාහරණ සහිතව ඉදිරිපත් කිරීම
  - ➢ හාස්‍ය මුසුවන දෙබස් හා උපහාසාත්මක කවි භාවිත කරන බව

    **උදාහරණ :**

    තෙමාලා රෙද්ද හැළියේ ඔබන කොට..........

    කපාලා දෙමුය ගම මහගෙ බරට ගාතයක්.........
  - ➢ ප්‍රෙක්ෂකයන් වෙතට ව්‍යංගාර්ථ සපයමින් නාට්‍යමය ලක්ෂණ පෙන්නුම් කරන බව
- **ආහාර්ය අභිනය**
  - ➢ වෙස් ඇඳුමෙන් සැරසුණු යක් දෙස්සා, බෙරකරු සමග රංගනය කරන බව
  - ➢ කෙසෙල්බඩ, ලී කෝටු යොදා ගනිමින් සකසා ඇති ඌරාගේ අනුරුවක් භාවිත කරන බව
  - ➢ දූන්න, ඊතලය හා සුදු රෙදිකඩක් චරිත නිරූපණයේ දී භාවිත කරන බව

**වාචික අභිනය පිළිබඳ විමසීමට ලකුණු** 04

**ආහාර්ය අභිනය පිළිබඳ විමසීමට ලකුණු** 04

**මුළු ලකුණු** 08

**(i) 6 + (ii) 6 + (iii) 8 = මුළු ලකුණු** 20

**(05) ගැමි නැටුම් සහ ගායනා මගින් ග්‍රාමීය සංස්කෘතිය පිළිබිඹු කරයි.**

(i) ගැමි නර්තනයන්හි දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න.

- සාමූහික බව
- ගායනය සහිත බව
- උපකරණ භාවිත කරන බව
- සරල රංගවස්ත්‍ර භාවිතා කිරීම........

**ලක්ෂණ තුනක් විස්තර කිරීමට ලකුණු** 2 X 3 = **06**

(ii) ජන ජීවිතයේ ඇදහිලි හා විශ්වාසය පිළිබඳ ගැමි නැටුම් **දෙකකට** අයත් ගායනා ඇසුරෙන් පැහැදිලි කරන්න.

- ඉරිදා දවසේ පන් උදුරන්නේ .............
- වරම් වරම් ඉර සඳ දෙවි අතින් වරම් ........
- බෝ අත්තට වැඳ සිරස නමන්නේ .........
- හිරු දෙවියන්ගේ ඉරගල ගාලා ...........

Department of Examinations - Sri Lanka

- මල් මාලා සොඳ වරම් ලබනවා .............
- ලොව සෙත් කරවන පත්තිනි සඳිනේ.............
- ජන ජීවිතයේ ඇදහිලි හා විශ්වාස මත ගැමි ගායනා හා ගැමි නැටුම් නිර්මාණය වී ඇති බව.

**ගැමි නැටුම් දෙකක ගායනා ඇසුරෙන් ඇදහිලි විශ්වාස පිළිබඳ පැහැදිලි කර ඇත්නම්**

**ලකුණු 3 X 2 = 06**

(iii) සිංහල හා දෙමළ සංස්කෘතික සමානතා, ගැමි නැටුම් **හතරක්** ඇසුරෙන් සංසන්දනාත්මකව විග්‍රහ කරන්න.

- **සිංහල ජන නැටුම්**
  - ➢ ලී කෙළි
  - ➢ කළගෙඩි
  - ➢ කුලු
  - ➢ ගොයම්
- **ද්‍රවිඩ ජන නැටුම්**
  - ➢ කෝලාට්ටම්
  - ➢ චෙම්බු
  - ➢ සුළකු
  - ➢ අරවිචෙට්ටු

**ගැමි නැටුම් හතරක් තෝරා සංස්කෘතික සමානතා පිළිබඳ සංසන්දනාත්මකව විග්‍රහ කර ඇත්නම්**

**ලකුණු 02 X 4 = 08**

**(i) 6 + (ii) 6 + (iii) 8 = මුළු ලකුණු 20**

**(06)** පහත සඳහන් වගුවෙහි (අ), (ආ), සහ (ඉ) යන කොටස්වලට අදාළව අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i). (අ) කොටස - භරත නාට්‍යම් සම්ප්‍රදායට අයත් 'නෘත්‍ය' අංගය තෝරාගෙන ඒ පිළිබඳ විස්තරයක් කරන්න.

- **ශබ්දම්**
  - ➢ භරත නාට්‍යම් 'අරංගේත්‍රම්' සංදර්ශනයක, භාව ප්‍රකාශනාත්මකව යෙදෙන ප්‍රථම නර්තන අංගය බව
  - ➢ අක්ෂි හා ගෙලෙහි චලන අවබෝධයෙන් යුතුව කෙටි ජති කොටස් භාවිත කරමින් නර්තන සිදු කෙරෙන බව
  - ➢ ක්‍රිෂ්ණාගේ හා ගෝපිකාවන් සතුටින් ගත කල කාලය, ක්‍රිෂ්ණාගේ රූව ගුණ, දේවත්වය අදාළ සිද්ධීන් නිරූපණය කෙරෙන බව

Department of Examinations - Sri Lanka

➢ භක්තිය දනවන ගීත ලෙස මෙන්ම රාගවලට අනුව මෙහි ගායනා සිදුකරනු ලබන බව

**තෝරා ගැනීමට ලකුණු 02**

**කරුණු ඇසුරෙන් විස්තර කිරීම ලකුණු 04**

**මුළු ලකුණු 06**

(ii) (ආ) බටහිර බැලේ සහ දේශීය මුද්‍රානාට්‍ය කෘති දෙක තෝරා ගෙන ඒ පිළිබඳ විමසුමක් කරන්න.

- නිදි කුමරිය
- බැරිසිල්

**නිදි කුමරිය**

➢ බටහිර බැලේ කෘතියක් බව
➢ රුසියාන් කතාවක් ඇසුරෙන් නිර්මාණය වී ඇති බව
➢ ශාන්ත පීටර්ස්බර්ග් නුවර 1890 ප්‍රථම වරට වේදිකා ගත වූ බව
➢ රංගරචනය, මාරියස් පෙටිපා හා සංගීත නිර්මාණය පීටර් චෙයිකොස්කිව් බව
➢ කතා පුවත හා රංගවස්ත්‍රාභරණ පිළිබඳ සැකෙවින් විමසුමට ලක්කර ඇති බව

**බැරිසිල්**

➢ ආරියරත්න කළුආරච්චි මහතා විසින් නිර්මාණය කර ඇති බව
➢ පහතරට නර්තන ශෛලියේ පද කොටස් ඇසුරෙන් නිර්මාණය වී ඇති බව
➢ හාස්‍ය, උපහාසය, හා සමාජ විවරණයන් කථා පුවත තුළින් පෙන්වා දී ඇති බව
➢ රංග වස්ත්‍රාභරණ සිල් සමාදන් වූ උපාසක අම්මාවරුගේ ස්වරූපය ගෙන ඇති බව
➢ සංගීතය සඳහා දේශීය අවනද්ධ භාණ්ඩ මෙන්ම විදේශීය වාද්‍ය භාණ්ඩ යොදා ගෙන ඇති බව

**තෝරා ගැනීමට ලකුණු 02**

**කරුණු දෙකක් ඇසුරෙන් විමසීමක් කර ඇත්නම් ලකුණු 2 X 2 = 04**

**මුළු ලකුණු 06**

(iii) (ඉ) බැලේ නර්තන කලාව ප්‍රංශය දක්වා ව්‍යාප්තියට පුරෝගාමී වූ දෙදෙනා නම් කර එහි ප්‍රවර්ධනයට ඔවුන්ගේ දායකත්වය ලැබී ඇති ආකාරය අගයන්න.

- කැතරින් ඩී. මෙඩිසි
- 14 වන ලුවී

➢ **කැතරින් ඩී.මෙඩිසි**

- ඉතාලි ජාතික ෆොලරන්ස් රාජකීය පරපුරින් පැවත එන බව

Department of Examinations - Sri Lanka

- 1553 දෙවෙනි හෙන්‍රි රජු සමග විවාහ වීමෙන් පසු බැලේ නර්තන සංස්කෘතිය රාජ සභාවට පැමිණි බව
- ප්‍රධාන සංගීතඥයෙකු වූ බැල්ත සා ජී බියුජොයියෙලෙක්ස් (Balthasar de Beanjo Yenlx) කැතරින් ඩී.මෙඩිසි බිසව විසින් රාජසභාවට කැඳවා ගත් බව

➢ **14 වන ලුවී**

- ප්‍රංශ නර්තන කලාවේ ස්වර්ණමය අවධිය බව
- බැලේ නිර්මාණ විසිහතකට නර්තන දායකත්වය ලබා දී ඇති බව
- හිරු දෙවියන්ගේ චරිත නිරූපණය හේතුවෙන් Sun king යන අන්වර්ත නාමයෙන් හඳුන්වන ලද බව
- 1672 දී Royal Accadamic dela Dance යනුවෙන් ආයතනයක් ආරම්භ කළ බව

**බැලේ ශිල්පීන් දෙදෙනා නම් කිරීමට ලකුණු 02**
**දායකත්වය ලැබී ඇති ආකාරය ඇගයීමට ලක් කර ඇත්නම් ලකුණු 06**
**මුළු ලකුණු 08**
**(i) 6 + (ii) 6 + (iii) 8 = මුළු ලකුණු 20**

**(07) නර්තන කලාව ප්‍රවර්ධනයෙහිලා පෙර අපර දෙදිග සංස්කෘතික සබඳතා ඉවහල් වී ඇත.**

(i) 'පටාචාරා කලා කෘතිය විවිධ නර්තන ශෛලීන්ගෙන් පෝෂණය වූවකි' පහදන්න.

- **පෙරදිග ආභාෂය**
  උඩරට, පහතරට, දේශීය ගැමිනැටුම්, මෙන්ම භරත, කතක් නර්තන සම්ප්‍රදායන් යොදා ගෙන ඇති බව
- **අපරදිග ආභාෂය**
  අංගහාර, පැනීම්, කැරකීම් බටහිර බැලේ සම්ප්‍රදාය ඇසුරෙන් යොදා ගෙන ඇති බව

**පෙර අපර දෙදිග නර්තන ශෛලීන් වෙන් කොට හඳුනාගෙන ඇත්නම් ලකුණු 02**
**උදාහරණ සහිතව පැහැදිලි කර ඇත්නම් ලකුණු 04**
**මුළු ලකුණු 06**

(ii) නර්තන කලාවේ නව ප්‍රවණතා කෙරෙහි ජනමාධ්‍යයේ බලපෑම නිදසුන් **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න.

- ප්‍රවීණ නර්තන ශිල්පීන් සහභාගී වන සාකච්ඡා මණ්ඩප හා වාර්තා වැඩ සටහන් මගින් නව ප්‍රවණතාවයන් සිදුවන බව
- රූපවාහිනී නාලිකා මගින් නර්තන තරග පැවැත්වෙන බව
- වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා නර්තනය යොදා ගන්නා බව



Department of Examinations - Sri Lanka

- නර්තන අවස්ථා සහ ස්වනිර්මාණයන් ජනමාධ්‍ය මගින් ප්‍රචාරය කිරීමට හැකි වන බව
- ගායන/වාදන/නර්තන/රංගවස්ත්‍රාභරණ හා නව නිර්මාණ ආදී ක්ෂේත්‍රයන් පිළිබඳ ඇගයීමට ලක් කිරීම

**කරුණු තුනක් ඇසුරෙන් විස්තර කර ඇත්නම් ලකුණු 2 X 3 = 06**

(iii) බටහිර හා පෙරදිග රටවල සංස්කෘතික ලක්ෂණ දේශීය නර්තනයට බලපා ඇති ආකාරය කරුණු **හතරක්** ඇසුරෙන් විමසුමට ලක් කරන්න.

- චලන
- රංගවස්ත්‍රාභරණ
- සංගීතය
- ආලෝකකරණය
- අංගරචනය
- තාක්ෂණික භාවිතය
- රංග සැලසුම්කරණය
- පසුතල නිර්මාණ

**කරුණු හතරක් තෝරා ගැනීමට ලකුණු** 04

**විමසුමට ලක් කර ඇත්නම් ලකුණු** 04

**මුළු ලකුණු** 08

**(i)** 6 **+ (ii) 6 + (iii) 8 = මුළු ලකුණු** 20

**(08) අංග රචනය සහ රංගවස්ත්‍රාභරණ නිර්මාණය නර්තන කලාව හා බැඳි විස්තාරණය වූ විශේෂාංග වේ.**

(i) අද්‍යතනයේ අංග රචනය සඳහා යොදා ගන්නා ප්‍රධාන අමු ද්‍රව්‍ය දෙකක් නම් කර ඒ පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.

- පදනම් ආලේපන
- තොල් ආලේපන
- නෙත් අංජන
- මස්කාරා ................ ආදී

**අමුද්‍රව්‍ය දෙකක් නම් කිරීමට ලකුණු** 02

**කෙටියෙන් විස්තර කිරීමට ලකුණු** 04

**මුළු ලකුණු** 06



Department of Examinations - Sri Lanka

(ii) රංගවස්ත්‍රාභරණ නිර්මාණය කිරීමේ දී අංග, ප්‍රත්‍යාංග හා උපාංග පිළිබඳ සැලකිලිමත් විය යුතු බව සම්ප්‍රදායික ඇඳුම් කට්ටලයක් ඇසුරෙන් සාකච්ඡා කරන්න.

- සාම්ප්‍රදායික ඇදුම් කට්ටල පිළිබඳ වෙනස්කම් හඳුනා ගෙන ඇති බව
- අංග, ප්‍රත්‍යාංග, උපාංග ක්‍රියාකාරීත්වය සිදුවන ආකාරය පිළිබඳ අවබෝධය තිබිය යුතු බව
- අපේක්ෂිත නර්තන චලන වඩාත් තීව්‍ර කිරීමට රංගවස්ත්‍ර භාවිතා කර ඇති බව
- රංගවස්ත්‍රාභරණ නිර්මාණයේ දී අමුද්‍රව්‍ය පිළිබඳ අවබෝධය හා චලන භාවිතයට පහසු වන ආකාරය හඳුනා ගැනීම.
- නර්තනයට පහසුවන ආකාරයෙන් සැහැල්ලු අමුද්‍රව්‍ය භාවිත කළ යුතු බව

**කරුණු ඇසුරෙන් සාකච්ඡා කර ඇත්නම් ලකුණු 06**

(iii) ආලෝක වර්ණ (Light colour) හා ද්‍රව්‍ය වර්ණ (Pigment colour) රංගවස්ත්‍රාභරණ සඳහා වැදගත්වන ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

- ආලෝකවර්ණ හා ද්‍රව්‍ය වර්ණ හඳුනා ගෙන ඇති බව
- නිර්මාණයට සුදුසු වර්ණ තෝරා ගැනීමේ අවබෝධය වැදගත් බව
- රංගවස්ත්‍රාභරණ නිර්මාණයේ දී ආලෝකකරණය පිළිබඳ අවබෝධයක් තිබිය යුතු බව
- ආභරණ නිර්මාණයේ දී වර්ණ, රේඛා, හැඩතල, අමුද්‍රව්‍ය මෙන්ම ආලෝකකරණයෙහි භාවිතය වැදගත් බව

**ආලෝක වර්ණ හා ද්‍රව්‍ය වර්ණ හඳුනාගෙන තිබේ නම් ලකුණු 02**

**රංගවස්ත්‍රාභරණ සඳහා රංගාලෝකය වැදගත් වන ආකාරය පැහැදිලි කර ඇත්නම් ලකුණු 02**

**උදාහරණ සහිතව පැහැදිලි කර ඇත්නම් ලකුණු 04**

**මුළු ලකුණු 08**

**(i) 6 + (ii) 6 + (iii) 8 = මුළු ලකුණු 20**

Department of Examinations - Sri Lanka